# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1741/19 - 2012 ජනවාරි 19 වැනි බ්‍රහස්පතින්දා - 2012.01.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්.ඩී.බී. 14/2008.

**2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත**

2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනතේ 7 වන සහ 21 වන වගන්ති සමග කියවිය යුතු 51 වන වගන්තිය යටතේ පරිසර අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

අනුර ප්‍රියදර්ශන යාපා,
පරිසර අමාත්‍ය.

2012 දෙසැම්බර් මස 19 දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝගවල 2011 අංක 02 දරන බංකරින් (සමුද්‍රීය පරිසර ආරක්ෂණ) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මේ නියෝගවල සහ තෙල් නැව් සහ පර්යන්ත සඳහා වූ ජාත්‍යන්තර ආරක්ෂක මාර්ගෝපදේශ (ISGOTT) වල අන්තර්ගත විධිවිධාන මුහුදේ සහ ගොඩබිමේ ඇති සියලුම බංකර් තෙල් සැපයුම් පහසුකම් වලට අදාළ විය යුතු ය.

3. මේ නියෝගවල III වන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන ආකෘති පත්‍රයෙහි තත්කාර්ය සඳහා (මෙහි මින්මතු "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන) සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් පසු තත් කාර්ය සඳහා අධිකාරිය විසින් නිකුත් කරනු ලබන වලංගු බංකරින් බලපත්‍රයක අධිකාරය යටතේ හැර මේ නියෝග ක්‍රියාත්මක වීමේ දින සිට ශ්‍රී ලංකාවේ දේශීය ජල තීරයෙහි හෝ වෙනත් යම් සමුද්‍රීය කලාපයක හෝ එහි අක් වෙරළෙහි සහ ශ්‍රී ලංකාවේ වෙරළ කලාපයෙහි බංකරින් ක්‍රියාකාරකමක් සිදු නොකළ යුතු ය.:

එසේ වුව ද මෙම නියෝග ක්‍රියාත්මක වන දිනයේ දී බංකරින් කටයුතු සිදුකරමින් සිටින යම් තැනැත්තකු විසින් එම දිනයේ සිට මාස තුනක් ඇතුළත මෙම නියෝගවල I වන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන ආකෘති පත්‍රයෙන් අධිකාරිය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර එම කටයුත්ත සම්බන්ධයෙන් වලංගු බංකරින් බලපත්‍රයක් ලබා ගත යුතු ය.

1A - G 15573 — 935 (2012/01)

4. 3 වන නියෝගය යටතේ ඉදිරිපත් කරන ලද බංකරින් බලපත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලීමක්ම V වන උපලේඛනයේ සඳහන් ගාස්තුව ද සමඟ අවස්ථාවෝචිත පරිදි එක් එක් බංකර් සැපයුම් යාත්‍රාවට හෝ මාර්ග ප්‍රවාහන (බංකරයට) අදාළ පහත දැක්වෙන ලේඛනවල පිටපත් ද සමඟ ඉදිරිපත් කළ යුතු ය.

(අ) සමුද්‍ර දූෂණය පිළිබඳ වගකීම සඳහා වූ රක්ෂණ සහතිකය; (සිදු වූ අලාභය පිරිසිදු කිරීමේ වියදම ද ඇතුළුව)

(ආ) බංකර් පහසුකම් කාර්ය පටිපාටි අත්පොත ;

(ඇ) නැවේ තෙල් දූෂණය පිළිබඳ හදිසි සැළැස්ම ; (SOPEP)

(ඈ) වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද නැවේ වෙළඳාම් සහතික ලේඛනය සහ වර්තමාන සමීක්ෂණ සහතිකය හෝ මුහුදු යාමේ යෝග්‍යතාවය පිළිබඳ සහතිකය ;

(ඉ) ඛනිජ තෙල් සම්පත් සංවර්ධන විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද බංකර් බලපත්‍රය ;

(ඊ) ඛනිජ තෙල් නිෂ්පාදන ප්‍රවාහනය සඳහා බලය පවරමින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක්.

5. (1) ඉල්ලීමක් ලැබීමෙන් පසු සහ එම ඉල්ලීමේ සපයා ඇති තොරතුරු පිළිබඳව අධිකාරිය සෑහීමට පත්වන්නේ නම් අධිකාරිය විසින් iv වන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන ආකෘතියට අනුව එම බලපත්‍රයේ සඳහන් කරනු ලැබූ කොන්දේසිවලට යටත්ව බංකරින් බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) යම් බලපත්‍රයක් නිකුත් කරනු ලැබූ දින සිට අවුරුදු එකක කාලයක් සඳහා එම බලපත්‍රය වලංගු විය යුතු අතර තත්කාර්ය සඳහා අධිකාරිය වෙත ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමක් මත එම බලපත්‍රය අළුත් කරනු ලැබිය හැකි ය.

(3) යම් බලපත්‍රයක වලංගු කාලය අවසන් වීමට මාස එකකට පෙර එකී බංකරින් බලපත්‍රය අළුත් කිරීම සඳහා වූ සෑම ඉල්ලීමක් සමඟම මෙහි V වන උපලේඛනයේ සඳහන් අළුත් කිරීමේ ගාස්තුව ද ඉදිරිපත් කළ යුතු ය. එසේ කරනු ලබන සෑම අළුත් කිරීමක් ම තත්කාර්ය සඳහා අධිකාරිය විසින් බලය පවරන ලද නිලධරයකු විසින් සිදු කරනු ලබන පරීක්ෂණයකට, විභාගයකට හෝ සමීක්ෂණ වාර්තාවකට යටත් විය යුතු ය.

6. (1) බලපත්‍රයක් නිකුත් කිරීම හෝ අළුත් කිරීම අධිකාරිය විසින් ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක දී එම ප්‍රතික්ෂේප කිරීම සඳහා හේතු දක්වමින් ස්වකීය තීරණය ඉල්ලුම්කරුට ලිඛිතව දැනුම් දිය යුතු ය.

(2) අධිකාරියේ තීරණයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් එකී තීරණය දැනුම් දීමේ දින සිට වැඩ කරන දින පහළොවක් ගතවීමට පෙර සමුද්‍ර දූෂණය පිළිබඳ විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත එකී තීරණයට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(3) (2) වන ඡේදය යටතේ ඉදිරිපත් කරන ලද අභියාචනයක සඳහන් සිද්ධිමය කරුණු සලකා බැලීමෙන් පසු සහ අභියාචනය ඉදිරිපත් කළ තැනැත්තාට කරුණු ඉදිරිපත් කිරීමේ අවස්ථාවක් ලබා දීමෙන් පසු ලේකම්වරයා විසින්-

(අ) අවස්ථාවෝචිත පරිදි අභියාචනයට ඉඩ දෙමින් බලපත්‍රයක් නිකුත් කරන ලෙස හෝ අළුත් කරන ලෙස අධිකාරියට විධාන කළ හැකි ය ; හෝ

(ආ) අභියාචනයට අවසර නොදිය හැකි ය.

(4) (3) වන ඡේදයේ සඳහන් අභියාචනයක් මත ලේකම්වරයා විසින් ගනු ලබන තීරණය අවසානාත්මක විය යුතු ය.

(5) මේ නියෝගවල (3) වන ඡේදය යටතේ ගන්නා ලද තීරණයට අනුකූලව අධිකාරිය විසින් ක්‍රියා කළ යුතු ය.

7. 3 වන නියෝගය යටතේ නිකුත් කරන ලද බංකරින් බලපත්‍රයක් -

(අ) පනතේ යම් විධිවිධානයක් හෝ එය යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ බලපත්‍රය නිකුත් කර ඇත්තේ යම් කොන්දේසිවලට යටත්ව ද එවැනි කොන්දේසියක් කඩ කරනු ලැබ ඇති අවස්ථාවක ; හෝ

(ආ) අධිකාරිය වෙත ඉදිරිපත් කර ඇති යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි සහගත වන අවස්ථාවක හෝ අදාළ දත්තයන් වසන් කර ඇති හෝ අවස්ථාවක ;

එම බලපත්‍රය අධිකාරිය විසින් අවලංගු කරනු ලැබිය හැකි ය ‍:

එසේ වුව ද බංකරින් බලපත්‍රය එසේ අවලංගු කිරීමට පෙර එම බලපත්‍රය නිකුත් කළ තැනැත්තාට කරුණු ඉදිරිපත් කිරීමේ අවස්ථාවක් ලබා දිය යුතු ය.

8. අධිකාරිය විසින් තීරණය කරනු ලබන ස්ථානයක දී පරීක්ෂණයක්, විභාගයක් හෝ සමීක්ෂණයක් පැවැත්වීමට පෙර අධිකාරිය විසින් ඉල්ලුම්කරු වෙත දින පහළොවක ලිඛිත දැනුම් දීමක් කළ යුතු අතර එහි දී අධිකාරිය විසින් දරනු ලබන සියලු වියදම් ඉල්ලුම්කරු විසින් දරනු ලැබිය යුතු ය.

9. බලයලත් මානකවරයකු විසින් පවත්වන ලද පරීක්ෂණයක්, විභාගයක් හෝ සමීක්ෂණයක් පිළිබඳ අවසන් වාර්තාව ලබා දීමට පෙර අදාළ බංකරින් පහසුකම සම්බන්ධයෙන් අවස්ථාවෝචිත පරිදි පහත දැක්වෙන දේ පිළිබඳ සුදුසු බව, වලංගු බව හෝ එය තිබීම පිළිබඳව සහතික කළ යුතු ය-

(අ) යම් තෙල් පිටාර ගැලීමක් පිළිබඳව මාපොල් (MARPOL) 73/78 සම්මුතියේ 1 වන ඇමුණුමේ 37 වන නියෝගයට අනුකූලව තෙල් පිටාර ගැලීමේ සිද්ධියක් සීමා කිරීම සඳහා අධිකාරිය විසින් අනුමත කරන ලද "තෙල් දූෂණ හදිසි සැළැස්මක් නැව තුළ තිබීම" හෝ අධිකාරිය විසින් අනුමත කරන ලද විකල්ප වැඩ පිළිවෙළක් තිබීම ;

(ආ) තෙල් වලින් සමුද්‍ර දූෂණය වීම වැළැක්වීම සඳහා වූ උපකරණ සහ සවිකිරීම් වල මෙහෙයුම් තත්වය සහතික කරමින් නිකුත් කරන ලද "ජාත්‍යන්තර තෙල් දූෂණ වැළැක්වීමේ සහතිකයේ" (International Oil Pollution Certificate) වලංගුභාවය ;

(ඇ) ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානය (International Maritime Oraganization) මගින් කලින් කල සංශෝධනය කරන ලද 1974 මුහුදේ දී ජීවිතයේ ආරක්ෂාව සඳහා වූ ජාත්‍යන්තර සම්මුතියට (SOLAS 1974) අනුකූලව බංකර් සැපයුම් යාත්‍රාවේ මුහුදු ගමන් සඳහා යෝග්‍යතාවය ;

(ඈ) අවස්ථාවෝචිත පරිදි යාත්‍රාව හෝ පහසුකම මුදාහැරීම සහ ලබාගැනීම පිළිබඳ බංකරින් අත්පොත තිබීම ;

(ඉ) "නැවේ ස්ථායිභාවය පිළිබඳ පොත" සහ තෙල් නැව්වල මැනීමේ සටහන/ වගුව තිබීම ;

(ඊ) හදිසි වැසීමේ වැල්ව්, දුරස්ථ පාලක, ඇතුළු ටැංකි, නල පද්ධති සහ ඊට ආශ්‍රිත උපාංග සවිකර ඇති ස්ථාන දක්වන නැවෙහි සැළැස්ම, එවැනි සියලු වැල්වයන් අන්තරාදායක ලෙස හදිසියේ විවෘත වීම හෝ වැසීම සිදුවීම වැළැක්වීම සඳහා "විවෘත" හෝ "වසා ඇති" යන අවස්ථා පෙන්වනු ලබන ලේබලයක් හෝ ඇමුණුමක් අලවා තිබිය යුතු ය ;

(උ) නම් කරන ලද ටැංකි වල තෙල් පැටවීමේ සහ බෑමේ සැළැස්ම ;

(ඌ) දෘශ්‍ය සන්නිවේදන උපකරණ තිබීම, සහ ජාත්‍යන්තර සංඥා රීතිවලට අනුකූලව ඒවායේ සංඥා සකස් කර ඇති පිළිවෙල පෙන්වීමට සැළැස්වීම (international code of Signals) ;

(එ) දිවා කාලයේ දී දර්ශනය පැහැදිලි නොමැති අවස්ථාවලදී හෝ මීදුම සහිත පසුබිමක් ඇති අවස්ථාවලදී නාවුක යාත්‍රා විදුලි පහන් ;

(ඒ) අවශ්‍ය වන පරිදි, බංකර් සැපයුම් යාත්‍රාවේ පාලම/ එන්ජින් කාමරය/ පොම්ප කිරීමේ කාමරය ආදිය ඇතුළත හා අතර ඇතුළු බඩු ගොඩබෑමේ යාත්‍රා සහ බඩු පැටවීමේ යාත්‍රා/ පහසුකම් අතර ඵලදායී ගුවන් විදුලි සන්නිවේදනය ;

(ඔ) නැවේ ලොග් සටහන් පොත, සිද්ධි ලොග් පොත, සහ තෙල් වාර්තා පොත වැනි මෙහෙයුම් ලේඛන නඩත්තු කිරීම සහ පවත්වාගෙන යාම ;

(ඕ) අවස්ථාවෝචිත පරිදි බංකර් සැපයුම් යාත්‍රාවේ හෝ පහසුකමේ අවම ආරක්ෂක කාර්ය මණ්ඩලය, කාර්ය මණ්ඩලයේ සුදුසුකම් සහ ප්‍රවීණතාවන්, අන්තර් ජාතික සමුද්‍රිය සංවිධානය විසින් සංශෝධනය කළ 1978/1995 මුහුදු යන්නන් සඳහා වූ පුහුණුව සහතික කිරීම සහ මුරකාවල් කිරීම පිළිබඳ සම්මුතියට අනුකූලව විය යුතු ය.

(ක) බංකරින් කටයුතු සිදු කරනු ලබන ප්‍රදේශය තුළ සහ ඒ අවට ප්‍රමාණවත් විදුලි ආලෝකය සැපයීමේ වැඩ පිළිවෙල ;

(ග) හදිසි අවස්ථාවක දී ගින්නක් මැඩපැවැත් වීම (Fire Suppression) සඳහා වූ සූදානම.

10. ප්‍රමාණවත් දිගකින් යුත් (නියමිත ප්‍රමාණයේ) "ඔයිල් බූම්" (Oil Booms) ක්ෂණිකව දියත් කිරීම සඳහා, පහසුවෙන් ප්‍රවේශ විය හැකි පරිදි සූදානම් තත්වයෙන් නැංගුරන් කඹ සහිතව ගබඩාකර පවත්වාගෙනයාමට යාත්‍රාවෙහි පහසුකම් ඇති බවට යම් බංකර් සැපයුම් යාත්‍රාවක හෝ පාවෙමින් පවතින බංකර් ගබඩා පහසුකමක අයිතිකරු, ක්‍රියාකරන්නා, නෞකාධිපති හෝ නියෝජිතයා වග බලා ගත යුතු ය.

11. යම් බංකර් සැපයුම් යාත්‍රාවක හෝ පාවෙමින් පවතින බංකර් ගබඩා පහසුකමක අයිතිකරු, ක්‍රියාකරු, නෞකාධිපති හෝ නියෝජිතයා විසින් -

(1) උතුරාගිය තෙල් ලීටර් එක් දහසක් අවශෝෂණය කිරීම සඳහා ප්‍රමාණවත් වන පහත දැක්වෙන දූෂණ පාලනය කිරීමේ ද්‍රව්‍ය එකී යාත්‍රාව හෝ පහසුකම තුළ ඇති බවට ;

(අ) නැවත භාවිත කළ හැකි විශේෂ අධිඅවශෝෂණ ද්‍රව්‍යවල සෑහෙන ප්‍රමාණයක් ;

(ආ) බැහැර කළ හැකි අවශෝෂණ ද්‍රව්‍යවල සහ පිරිසිදු කිරීමේ ද්‍රව්‍යවල සෑහෙන ප්‍රමාණයක් ; සහ

(ඇ) පිටාර ගැලූ තෙල් බැහැර කිරීමේ ද්‍රව්‍ය සෑහෙන ප්‍රමාණයක්.

(2) නැව තුළ සියලු තෙල් රැගෙන යාම නම් කරන ලද සහ අනුමත කරන ලද ඉඩ ප්‍රමාණවලදී පමණක් සිදු කළ යුතු ය.

12. තෙල් පිටාර ගැලීම් රඳවා තබා ගැනීම සහ ඉවත් කිරීම සඳහා සෑම මාර්ග ප්‍රවාහන (බංකර්) එකකට ප්‍රමාණවත් පිටාර ගැලීම රඳවා තබා ගැනීමේ උපකරණයක් තිබිය යුතු අතර ඊට පහත දැක්වෙන දේ ඇතුළත් විය යුතු ය-

(අ) අවශෝෂණ ද්‍රව්‍ය ;

(ආ) ලී කුඩු හෝ අවශෝෂණ පෑඩ් ;

(ඇ) ගිනි නොගන්නා බූම් (Booms) ;

(ඈ) සවල් සහ බාල්දි ;

(ඉ) අත්මේස්, බූට් සපත්තු සහ අක්ෂි ආරක්ෂක උපකරණ ඇතුළු උචිත පුද්ගල ආරක්ෂක උපකරණ.

13. බංකර් සැපයුම් යාත්‍රාවක හෝ පාවෙන ගබඩා කිරීමේ පහසුකමක සිට වෙනත් යාත්‍රාවකට හෝ පහසුකමකට තෙල් ගලායාම කඩිනමින් වැළැක්වීම සඳහා තෙල් මාරු කිරීම භාරව සිටින තැනැත්තකුට හැකි වන පරිදි අනුමත හදිසි පද්ධතියක් නැව තුළ සවිකර තිබිය යුතු ය.

14. යම් බංකර් සැපයුම් යාත්‍රාවක හෝ යම් බංකර් ගබඩා කිරීමේ පහසුකමක අයිතිකරු, ක්‍රියාත්මක කරන්නා, නෞකාධිපති හෝ නියෝජිතයා විසින් -

(අ) තොග ලොග් පොතක් ;

(ආ) තෙල් වාර්තා පොතක් ;

(ඇ) ලොග් පොතක්;

(ඈ) එන්ජින් කාමරයේ ලොග් පොතක් ;

(ඉ) තෙල් උතුරායාමේ වාර්තා,

නැව තුළ තබා ගත යුතු ය.

15. අවස්ථාවෝචිත පරිදි බංකර් සැපයුම් යාත්‍රාවක මාරු කිරීමේ සේවාව භාරව සිටින තැනැත්තා සහ බංකර් ලබාගැනීමේ යාත්‍රාවක හෝ බංකර් ගබඩා කිරීමේ පහසුකමක් භාරව සිටින තැනැත්තා අතර, පැති දෙකකට ක්‍රියා කරන ශබ්ද සන්නිවේදන පද්ධතියක් යම් බංකර් සැපයුම් යාත්‍රාවක, වාහනයක හෝ යම් බංකර් ගබඩා කිරීමේ පහසුකමක ඇතුළත සවිකර තිබිය යුතු ය.

16. (1) යම් බංකර් සැපයුම් යාත්‍රාවක බංකරයක මාර්ග ප්‍රවාහන (බංකරයක) හෝ බංකර් ගබඩා කිරීමේ පහසුකමක, අයිතිකරු, ක්‍රියාකරවන්නා හා නෞකාධිපති හෝ නියෝජිතයා විසින් කලින් පැවති මාසය ඇතුළත සිදු කරන ලද බංකර් සේවා සම්බන්ධයෙන් වූ මාසික ලැයිස්තුවක් එක් එක් මාසයේ පහළොස්වන දිනට පෙර අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතු ය. ඊට කලින් පැවති මාසය තුළ දී බංකරින් සේවා ඉටුකර නොමැති අවස්ථාවක දී එම බංකර් සැපයුම් යාත්‍රාවේ හෝ බංකර් ගබඩා කිරීමේ පහසුකමේ එක් එක් අයිතිකරු, ක්‍රියා කරවන්නා, නෞකාධිපති හෝ නියෝජිතයා විසින් ඒ මාසය සම්බන්ධයෙන් ශූන්‍ය ලැයිස්තුවක් ඉදිරිපත් කළ යුතු ය.

(2) එක් එක් බංකර් සැපයුම් යාත්‍රාවේ හෝ බංකර් ගබඩා කිරීමේ පහසුකමේ අයිතිකරු, ක්‍රියාකරවන්නා, නෞකාධිපති හෝ නියෝජිතයා මේ නියෝගවල ඉහත (1) වන ඡේදයේ සඳහන් මාසික ලැයිස්තුව හෝ ශූන්‍ය ලැයිස්තුව ඉදිරිපත් කිරීම පැහැර හරින අවස්ථාවක අධිකාරිය විසින් බලපත්‍රය එක් මාසයක කාලයකට අත්හිටුවා ඒ සඳහා වූ හේතු බංකර් සැපයුම් යාත්‍රාවේ මාර්ග ප්‍රවාහන බංකරයේ හෝ බංකර් ගබඩා කිරීමේ පහසුකමේ අයිතිකරු, ක්‍රියාකරවන්නා, නෞකාධිපති හෝ නියෝජිතයා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

(3) ඉහත (2) වන ඡේදය යටතේ අධිකාරියේ තීරණයකින් අතෘප්තියට පත් යම් තැනැත්තෙක් එම තීරණය දැනුම් දීමේ දින සිට වැඩ කරන දින පහළොවක් ගතවීමට පෙර එම තීරණයට එරෙහිව සමුද්‍ර දූෂණය පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි ය.

(4) ඉහත (3) වන ඡේදය යටතේ ඉදිරිපත් කරන ලද අභියාචනයේ සඳහන් සිද්ධිමය කරුණු සැළකිල්ලට ගැනීමෙන් පසු ලේකම්වරයා විසින් අභියාචනය ඉදිරිපත් කළ තැනැත්තා වෙත කරුණු ඉදිරිපත් කිරීමේ අවස්ථාවක් ලබා දීමෙන් පසු -

(අ) අවස්ථාවෝචිත පරිදි අභියාචනයට ඉඩ දෙමින්, බලපත්‍ර අත්හිටුවීම, අවලංගු කරන ලෙස අධිකාරියට විධාන කළ හැකි ය; හෝ

(ආ) බලපත්‍රය අත්හිටු වීම ඉවත් කිරීමේ කාර්යය සඳහා සපුරාලිය යුතු යම් නියම, කොන්දේසි නියම කරමින් අභියාචනය නිෂ්ප්‍රභා කරනු ලැබිය හැකි ය.

(5) අභියාචනය පිළිබඳව ලේකම්වරයා විසින් දෙන ලද තීරණය අවසානාත්මක විය යුතු ය.

(6) මේ නියෝගවල (4) වන ඡේදය යටතේ අධිකාරිය වෙත නිකුත් කරන ලද යම් තීරණයකට අනුකූලව අධිකාරිය විසින් ක්‍රියා කළ යුතු ය.

17. තෙල් උතුරායාමක් සිදු වීමේ දී -

(අ) බංකර් සැපයුම් යාත්‍රාවක, වාහනයක හෝ පාවෙන බංකර් ගබඩා කිරීමේ පහසුකමක අයිතිකරු, ක්‍රියාකරන්නා, නෞකාධිපති හෝ නියෝජිතයා විසින් එකී පිටාර ගැලීම පිළිබඳව වහාම අධිකාරිය වෙත දැනුම් දිය යුතු ය; සහ

(ආ) තෙල් උතුරායාමේ අවදානම අවම කිරීම සඳහා වහාම ඔයිල් බූම් ක්‍රියාත්මක කිරීම සහ දියත් කිරීම සිදු කරන බවට බංකර් සැපයුම් යාත්‍රාවේ හෝ පාවෙන බංකර් ගබඩා කිරීමේ පහසුකම් ලබා ගන්නා යාත්‍රාවේ අයිතිකරු, ක්‍රියාකරන්නා, නෞකාධිපති හෝ අනුයෝජිතයා විසින් වග බලා ගත යුතු අතර තෙල් උතුරායාමක් පිරිසිදු කිරීම සඳහා අවශ්‍ය ක්ෂණික පියවර ගත යුතු ය.

18. පාවෙන බංකර් තෙල් ගබඩා පහසුකමකින් යම් තෙල් මාරුකිරීමක් සිදුවිය යුත්තේ අධිකාරිය විසින් තීරණය කරනු ලබන ප්‍රදේශයක දී පමණී.

19. පාවෙන බංකර් ගබඩා පහසුකමක ස්ථාන භාර නිලධරයා විසින්, අධිකාරිය විසින් තීරණය කරනු ලබන ආකාරයට පහත දැක්වෙන වාර්තා පවත්වාගෙන යාමට කටයුතු කළ යුතු ය.

(අ) තොග සංසරණ ලොග් පොත ;

(ආ) තෙල් උතුරායාමේ වාර්තාව ;

(ඇ) දෛනික සිදුවීම් ලොග් පොත.

20.(1) මේ නියෝග යටතේ බංකර් යාත්‍රාව මගින් සිදු කරනු ලබන සියළු බංකර් කටයුතු තෙල් වාර්තා පොතේ වහාම සටහන් කරනු ලැබිය යුතු ය.

(2) තෙල් වාර්තා පොතේ සෑම පිටුවක්ම අදාළ පහසුකමේ ස්ථානභාර නිලධරයා විසින් අත්සන් කළ යුතු ය.

(3) සියළු අවස්ථාවන් හී දී අධිකාරිය විසින් පරීක්ෂා කිරීම සඳහා සියළු තෙල් වාර්තා පොත් පහසුවෙන් ලබාගත හැකි පරිදි තැබිය යුතු ය.

(4) ඇදගෙන යනු ලබන ස්වයංව පාවෙන බංකර් සැපයුම් පහසුකමක් සම්බන්ධයෙන් වන විට සියළු තෙල් වාර්තා පොත් ඇදගෙන යන යාත්‍රාව (towing vessel) ඇතුළත තැබිය යුතු ය.

(5) පනතේ විධිවිධාන හෝ මේ නියෝග යම් සේවානියුක්තයකු විසින් උල්ලංඝනය කිරීමේ දී අදාළ බංකර් සැපයුම් යාත්‍රාවේ හෝ පාවෙන බංකර් ගබඩා කිරීමේ පහසුකමේ අයිතිකරු, ක්‍රියාකරන්නා, නෞකාධිපති හෝ නියෝජිතයා ඒ සම්බන්ධයෙන් වගකීම භාරගත යුතු ය.

(6) පහත දැක්වෙන ක්‍රියාකාරකම්වලට අදාළ තොරතුරු එනම් -

(අ) ටැංකිය ඇතුළත හෝ එක් ටැංකියක සිට තවත් ටැංකියකට නැව් බඩු වශයෙන් ඇති තෙල් පැටවීමේ දී හෝ මාරු කිරීම ;

(ආ) නාවික ගමනක් අතරතුර නැව් බඩු වශයෙන් තෙල් මාරු කිරීම ;

(ඇ) නැව් බඩු වශයෙන් ඇති තෙල් ගොඩබෑම ;

(ඈ) නැව් බඩු රැගෙන යන තෙල් ටැංකිවලට ස්ථායිතාව රැකගැනීමට පිරවුම් ද්‍රව්‍ය යෙදීම (Ballasting) ;

(ඉ) නැව් බඩු ගෙන යන තෙල් ටැංකි පිරිසිදු කිරීම ;

(ඊ) අපවිත්‍ර වූ පිරවුම් ද්‍රව්‍ය (Ballast) ඉවත් කිරීම ;

(උ) අපිරිසිදු ජලය ඇති ටැංකිවලින් (Slop tanks) ජලය ඉවත් කිරීම ;

(ඌ) පතුලේ ඇති අපද්‍රව්‍ය ඉවත් කිරීම ; සහ

(එ) නැව වරාය තුළ තිබෙන විට යන්ත්‍ර සූත්‍ර අතර එකතු වී ඇති තෙල් සහිත ජලය නැවෙන් ඉවත් කිරීම සහ උචිත ලොග් පොත්වල ඇතුළත් කර තෙල් සහිත අපවිත්‍ර ජලය සුපුරුදු ලෙස මුහුදට බැහැර කිරීම

යන කරුණු තෙල් නැව් වල බංකරින් යාත්‍රාවල හෝ බංකර් සැපයුම් පහසුකම් වල ඇතුළත ඇති තෙල් වාර්තා පොතේ සටහන් කළ යුතු ය.

(7). වෙරළේ ඇති බංකර් සැපයුම් පහසුකමේ පහත දැක්වෙන ක්‍රියාකාරකම් සිදුවන සෑම අවස්ථාවක දී ම 19 වන නියෝගයේ සඳහන් එක් එක් වාර්තා පොත සම්පූර්ණ කරනු ලැබිය යුතු ය.

(අ) බංකර් තෙල් නැව් වලට බර යෙදීම හෝ ඒවා පිරිසිදු කිරීම ;

(ආ) තෙල් නෞකාවලින් අපිරිසිදු බර යෙදීමේ ද්‍රව්‍ය ඉවත් කිරීම හෝ ජලය ඉවත් කිරීම ;

(ඇ) තැන්පත් වී ඇති ද්‍රව්‍ය බැහැර කිරීම ; සහ

(ඈ) නැව් වරාය තුළ තිබෙන විට යන්ත්‍ර සූත්‍ර අතර එකතු වී ඇති තෙල් සහිත ජලය නැවෙන් ඉවත් කිරීම සහ තෙල් සහිත අපවිත්‍ර ජලය උචිත ලොග් පොත්වල ඇතුළත් කර ඇත්නම් මිස ඒවා නැවෙන් පිටතට බැහැර කිරීම.

21. බංකරින් සේවා ආරක්ෂිත පරිදි පවත්වාගෙන යන ලෙස සහ අවස්ථාවෝචිත පරිදි යාත්‍රාවේ අයිතිකරු, ක්‍රියාකරු, නෞකාධිපති හෝ නියෝජිතයා විසින් සහතික කරන ලද නිවැරදි ලොග් සටහන් නිසි පරිදි පවත්වාගෙන යන ලෙස බංකරින් සේවා භාරව සිටින තැනැත්තන්ට නියම කිරීම යම් බංකර් සැපයුම් යාත්‍රාවක හෝ පාවෙන හෝ වෙරළේ ඇති බංකර් ගබඩා කිරීමේ පහසුකමක අයිතිකරු, ක්‍රියාකරු, නෞකාධිපති හෝ නියෝජිතයකුගේ කාර්යය වන්නේ ය.

22. කිසිම තැනැත්තකු විසින් -

(අ) එක් අවස්ථාවක දී එක් යාත්‍රාවකට වැඩි යාත්‍රා ප්‍රමාණයක තෙල් බෙදා හැරීමේ සේවාව භාර තැනැත්තා වශයෙන් කටයුතු නොකළ යුතු ය ; සහ

(ආ) බෙදා හැරීමේ කාර්යයක් සමග අනුකූල වන්නේ නම් මිස, තෙල් බෙදා හැරීමේ කාර්යයක සේවය නොකළ යුතු ය.

23. (අ) කලින් දැනුම් දෙනු ලැබූ කාලගුණ තත්වයන් තුළ දී යාත්‍රාවේ කඹ දරා සිටීමට ප්‍රමාණවත් නම් මිස ;

(ආ) ආරක්ෂා සහිත ලෙස තෙල් මාරුකිරීම සඳහා කාලගුණ තත්වයන් හිතකර නම් මිස, සහ එසේ තෙල් මාරු කිරීම සඳහා යොදා ඇති උපකරණ ආරක්ෂිත සීමාවේ ඇත්නම් මිස ;

(ඇ) යාත්‍රාවට එහි කඹ වල සීමාව තුළ චලනය වීමට හැකිවන පරිදි තෙල් මාරු කිරීමේ සොඬ නල (HOSE) සහ පිරවීමේ උපකරණ ප්‍රමාණවත් ලෙස දිග ඇත්නම් මිස ;

(ඈ) සෑම නලයක්ම භාවිත කිරීමට පෙර හොඳින් පරීක්ෂා කර ඇත්නම් මිස ;

(ඉ) එක් එක් සොඬ නල වලට (HOSE) සිදුවන ආතතිය සහ අවපාතය, දඟර වැටුම්, ඇතිල්ලීම සහ වෙනත් යම් හානියක් වැළැක්වීම සහ බලපෑම අඩුකිරීම සඳහා එක් එක් නළයට නිවැරදිව සවිකර ආධාරක යොදා ඇත්නම් මිස ;

(ඊ) තෙල් මාරු කිරීමේ දී භාවිත කරනු නොලබන මාරු කිරීමේ නළ පද්ධතියේ එක් එක් කොටස ආරක්ෂා සහිත ලෙස ආවරණය කර ඇත්නම් හෝ සුදුසු පරිදි වසා ඇත්නම් මිස ;

(උ) යාත්‍රාවේ තෙල් මාරු කිරීමේ පද්ධතියට සවිකර ඇති එක් එක් බැහැර කිරීමේ හෝ මුහුදෙන් ජලය උරා ගැනීමේ වැල්වය, පැහැදිලි බර පැටවීමේ ද්‍රව්‍ය ලබා ගැනීමේ දී හෝ බැහැර කිරීමේ දී හැර, සීල් තබා ඇත්නම් වසා ඇත්නම් හෝ සුරක්ෂිත කොට ඇත්නම් මිස,

(ඌ) රඳවා තබා ගැනීමේ උපකරණ අදාළ තැන්වල සවිකර ඇත්නම් මිස ;

(එ) සන්නිවේදන උපකරණ පරීක්ෂා කොට ඒවා යහපත් ක්‍රියාකාරී තත්වයෙන් ඇත්නම් මිස ;

(ඒ) ක්ෂණික වසා තැබීමේ උපකරණ යහපත් ක්‍රියාකාරී තත්වයෙන් ඇත්නම් මිස ;

(ඔ) තෙල් මාරු කිරීමේ ස්ථාන දෙකේදීම නම් කරන ලද තැනැත්තන් රාජකාරී සඳහා යොදවා ඇත්නම් මිස ;

(ඕ) තෙල් මාරුකිරීමේ ස්ථාන දෙකේම සිටින වගකිවයුතු නිලධාරීන් අතර නිෂ්පාදන මාරු කිරීමේ අනුපිළිවෙල, මාරු කිරීමේ අනුප්‍රමාණය, හදිසි තත්ත්වයකට මුහුණ දීම නියාමනය කිරීම, දූෂණය පිළිබඳ වාර්තාව, දූෂණය මැඩලීමේ කාර්ය පටිපාටිය, ක්ෂණික වසා දැමීමේ කාර්ය පටිපාටිය, තෙල් මාරු කිරීමේ ස්ථාන දෙකෙහිම සිටින වගකිව යුතු බලධරයන් අතර සාකච්ඡා කර ඒ පිළිබඳව එකඟත්වයකට පත්ව ඇත්නම් මිස; සහ අදාළ සටහන් නියමිත ලොග් පොත්වල යොදා ඇත්නම් මිස ;

(ක) ප්‍රමාණවත් විදුලි ආලෝකය ඇත්නම් මිස ;

(ග) මුහුදු ගමන්කරුවකුගේ සියළු යහපත් පරිචයන් සහ ආරක්ෂාව පිළිබඳ පරිචයන් ක්‍රියාත්මක කර සහ ඊට අනුකූල වන්නේ නම් මිස ;

(ච) තෙල් මාරු කිරීමේ සේවාව භාරව සිටින තැනැත්තා එක් එක් මාරුකිරීම සම්බන්ධ සියළු ක්‍රියාකාරකම්වල ප්‍රමාණවත් පරිදි ප්‍රවීණයකු සහ පළපුරුදු තැනැත්තකු වන්නේ නම් මිස සහ ඔහු තෙල් උතුරායාම පිළිබඳ හදිසි සැළසුම පිළිබඳව සම්පූර්ණ දැනුමක් ඇත්නම් මිස ;

කිසිම තැනැත්තකු විසින් තෙල් මාරු කිරීමේ සේවාව නොකළ යුතු ය.

24. බංකර් පහසුකම්වල නියැලී සිටින සෑම යාත්‍රාවක්ම එම යාත්‍රාවේ අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා අධිකාරිය විසින් සළසනු ලබන මනා ලෙස සකස් කළ අපද්‍රව්‍ය භාරගැනීමේ පහසුකම භාවිත කළයුතු බවට අධිකාරිය විසින් නියම කරනු ලැබිය යුතු ය.

25. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මෙම නියෝගවල -

"පනත" යන්නෙන් 2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත අදහස් වේ;

"අනුමත බංකර් සැපයුම්කරු" යන්නෙන්, ශ්‍රී ලංකාවේ දේශීය ජල තීරයේ හෝ වෙනත් යම් සමුද්‍රීය කලාපයක ශ්‍රී ලංකාවේ පෙර වෙරළේ සහ වෙරළ කලාපයේ ඇති යාත්‍රාවලට තෙල් සැපයීම සඳහා සමුද්‍රීය ආරක්ෂණ අධිකාරිය විසින් අනුමත කරන ලද බංකර් සැපයුම් සමාගමක් අදහස් වේ.

" බලයලත් නිලධරයා" යන්නෙන්, 2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත යටතේ පිහිටුවන ලද සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ සභාපතිවරයා විසින් මෙම නියෝගවල කාර්ය සඳහා ලිඛිතව බලය පවරන ලද යම් නිලධරයෙක් අදහස් වේ.

"බංකරින්" යන්නෙන්, සමුද්‍රීය පරිසරය තුළ දී තෙල්, තෙල් ඉන්ධන හෝ වෙනත් තෙල් මිශ්‍රණයක් මාරු කිරීම අදහස් වේ.

"බංකරින් ක්‍රියාකාරකම්" යන්නෙන්, යාත්‍රාවක සිට තවත් යාත්‍රාවකට, ඉඩමකට, වාහනයකට හෝ වෙනත් යම් සවිකිරීමකට නැතහොත් ඒවායේ සිට එම යාත්‍රාවට බංකර් සැපයීමට අදාළ යම් ක්‍රියාකාරකමක් අදහස් වේ.

"බංකර් ලබාගැනීමේ යාත්‍රාව" යන්නෙන්, 73/78 මාපොල් (MARPOL) සම්මුතියේ 1 වන ඇමුණුම මගින් ආවරණය වන බංකර් හෝ වෙනත් තෙල් ලබා ගන්නා නෞකාවක් අදහස් වේ.

"බංකර් සැපයුම්කරු" යන්නෙන් විදුලි බල හා බල ශක්ති විෂය භාර අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලද වලංගු බංකර් සැපයුම් බලපත්‍රයක් දරන ලියාපදිංචි බංකර් සැපයුම් කරුවකු අදහස් වේ.

"පාවෙන බංකර් ගබඩා කිරීමේ පහසුකම" යන්නෙන්, බංකර් සැපයුම් යාත්‍රාවලට බංකර් සපයනු ලබන ගබඩා කිරීමේ තෙල් නැවක් අදහස් වේ.

"බංකර් සැපයුම් යාත්‍රාව" යන්නෙන් ලබාගන්නා නැවකට බංකර් සැපයුම් බෙදා හරින නෞකාවක් අදහස් වේ.

"නෞකාව" යන්නෙන්, 2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනතේ ලබා දී ඇති අර්ථ නිරූපණයම තිබිය යුතු ය.

"මහා මාර්ග ප්‍රවාහන" (බංකර්) යන්නට, යාත්‍රාවලට ලබාදීම සඳහා බංකර් ප්‍රවාහනය කිරීම සඳහා භාවිත කරනු ලබන යම් බවුසරයක්, ට්‍රක් රථයක් හෝ වෙනත් වාහනයක් අදහස් වේ.

**I වන උපලේඛනය**

***2008 අංක 35 දරන සමුද්‍රීය දූෂණය වැළැක්වීමේ පනත***

ඉල්ලුම්පත් අංකය [ ]

*ශ්‍රී ලංකාවේ ජලතීරයෙහි බංකරින් සේවා පවත්වාගෙන යෑම*
*සඳහා වූ බලපත්‍රයක් සඳහා වූ ඉල්ලීම.*
*(අළුත් සහ අළුත් කිරීම)*

ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන්නේ අළුත් බලපත්‍රයක් සඳහා ද නැතහොත් බලපත්‍රය අළුත් කිරීම සඳහා ද යන්න සඳහන් කරන්න.

(සුදුසු පරිදි සළකුණු කරන්න)

| | |
|---|---|
| නව | |
| අළුත් කිරීම | |

අළුත් බලපත්‍රයක් සඳහා නම් : අ සහ ඈ වගන්ති යටතේ විස්තර සපයන්න.

අළුත් කිරීමේ බලපත්‍රයක් සඳහා නම් : අ සහ ඉ වගන්ති යටතේ විස්තර සපයන්න.

අ වගන්තිය - ඉල්ලුම්කරුගේ / සමාගමේ විස්තර.

| | |
|---|---|
| අ1 සමාගමේ / වෙළඳ සමාගමේ නම | |
| අ2 ජාතිය | |
| අ3 ලියාපදිංචි කාර්යාල ලිපිනය | |
| අ4 ශ්‍රී ලංකාවේ ව්‍යාපාර ලිපිනය | |
| අ5 ව්‍යාපාර ලියාපදිංචි අංකය | |
| අ6 සබඳතා පිළිබඳ විස්තර | |
| (අ) පුද්ගලයාගේ නම | |
| (ආ) දුරකථන අංකය | |
| (ඇ) ෆැක්ස් අංකය | |
| (ඈ) විද්‍යුත් තැපැල | |
| අ7 ඉල්ලුම්කාර සමාගම/ අයදුම්කරු විසින් දරනු ලබන කොටස් වල ප්‍රතිශතය | |
| අ8 වෙනත් තැනැත්තන් විසින් දරනු ලබන කොටස්වල ප්‍රතිශතය (විස්තර දක්වන්න) | |

ආ වගන්තිය -

ආ1 බංකර් සේවා සැපයීම සඳහා භාවිත කරනු ලබන යාත්‍රාව පිළිබඳ විස්තර
විස්තර ඉදිරිපත් කර පිටපත් අමුණන්න.

| | |
|---|---|
| අ. නැවේ නම | |
| ආ. ශුද්ධ ධාරිතාව | |
| ඇ. හඳුනාගැනීමේ අංකය | |
| ඈ. ලියාපදිංචි වරාය | |
| ඉ. ලියාපදිංචි අංකය/ දිනය | |

| | |
|---|---|
| ඊ. හිස් යාත්‍රාවේ බර | |
| උ. ඉදිකිරීමේ දිනය හෝ අවසන් වරට වියළි තටාකයේ තිබූ දිනය | |
| ඌ. යාත්‍රාව ඉදිකළ සමාගමේ අංගන ලිපිනය | |
| එ. යාත්‍රා අයිතිකරුගේ සම්බන්ධිත ලිපිනය | |
| ඒ. කුලියට ගැනීමේ වර්ගය (සුදුසු පරිදි ලකුණු කරන්න) | (i) වේලාව (ii) පරිමාව (iii) මුහුදු ගමන |

ආ2 තෙල් පිටාර ගැලීමේ ප්‍රතිචාර හැකියාව
(යාත්‍රා ගණන එකකට වැඩි නම් වෙන් වශයෙන් සඳහන් කරන්න)

ආ2. 1 ඔයිල් බූම්

| *වර්ගය* | *දිග (මීටර්)* |
|---|---|
| | |
| | |
| | |

ආ2. 2 තෙල් පිටාර ගැලීමේ විසුරුම්කාරක

| *නිෂ්පාදන නාමය* | *වර්ගය* | *ප්‍රමාණය (ලීටර)* |
|---|---|---|
| | | |
| | | |
| | | |

ආ2. 3 තෙල් අවශෝෂණය

| *නිෂ්පාදන නාමය* | *වර්ගය* | *ප්‍රමාණය (ලීටර)* |
|---|---|---|
| | | |
| | | |
| | | |

ආ2. 4 වෙනත් (නිශ්චිතව දක්වන්න)

| *නිෂ්පාදන නාමය* | *වර්ගය* | *ප්‍රමාණය (ලීටර)* |
|---|---|---|
| | | |
| | | |
| | | |

ඇ- වගන්තිය - ඉදිරිපත් කළ යුතු ලේඛන
(සුදුසු පරිදි ලකුණු කරන්න)

| | |
|---|---|
| ඇ1 දූෂණ වගකීම් සඳහා වූ රක්ෂණ සහතිකය | |
| ඇ2 බංකර් පහසුකම් කාර්ය පටිපාටි අත්පොත | |
| ඇ3 හදිසි අවස්ථා ප්‍රතිචාර අත්පොත | |
| ඇ4 ශ්‍රී ලංකා වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද නැවේ ලියාපදිංචි ලේඛනය | |
| ඇ5 ඛනිජ තෙල් සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද බංකරින් බලපත්‍රයේ පිටපත | |

නියෝගවල සඳහන් පරිදි ඉල්ලා ඇති ලේඛන සියල්ල ඉදිරිපත් කරන්න.

ඇ - වගන්තිය - ගබඩා කිරීම සහ ක්‍රියාකිරීම

ඇ1 ගබඩා කිරීමේ පහසුකම් පිළිබඳ විස්තර
(සුදුසු පරිදි ඉදිරිපත් කරන්න)

| ගබඩා කර ඇති අයිතම | පිහිටීම | ගබඩා කළ හැකි ටැංකිවල ධාරිතාව | පාවෙන ගබඩාවේ ධාරිතාව |
|---|---|---|---|
| ඇ1.1 වාහන ඉන්ධන (AGO) | | | |
| ඇ1.2 ඉන්ධන තෙල් | | | |
| ඇ1.3 වෙනත් (නිශ්චිතව දක්වන්න) | | | |
| I. | | | |
| II. | | | |

ඇ2 මෙහෙයුම් කාර්යාල පිළිබඳ විස්තර (අ6 වෙනස්කම්)

| | |
|---|---|
| ඇ2.1 සම්බන්ධිත තැනැත්තාගේ නම | |
| ඇ2.2 ලිපිනය | |
| ඇ2.3 දුරකථන අංකය | |
| ඇ2.4 ෆැක්ස් අංකය | |
| ඇ2.5 විද්‍යුත් ලිපිනය | |

ඉ- වගන්තිය - නිකුත් කළ බලපත්‍රය අළුත් කිරීම.

ඉ1- පසුගිය මාස 12 ඇතුළත බංකර් සේවා සඳහා බාරගනු ලැබූ යාත්‍රා පිළිබඳ විස්තර
(පහත දැක්වෙන ආකෘතියට අනුව උපලේඛනය අමුණන්න.)

| යාත්‍රාවල නම් | සුදුසු දිනය | පරිමාණය මෙ.ටො | වටිනාකම | පිහිටීම | නැව්භාර බලපත්‍රයේ අංකය සහ දිනය |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |

මෙම ඉල්ලුම් පත්‍රයේ මා විසින් ඉදිරිපත් කර ඇති විස්තර සත්‍ය හා නිවැරදි බවට මම මෙයින් සහතික කරමි. මෙහි සඳහන් යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බවට සොයාගනු ලැබුවහොත් මගේ ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කරන බවත් බලපත්‍රය අවලංගු කරන බවත් මම දනිමි.

.........................................................

ඉල්ලුම්කරුගේ අත්සන                    නිල මුද්‍රාව සහ දිනය

................................................................................................................................................

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි.
ඉල්ලුම්පත්‍ර ගාස්තුව

මුදල් ගෙවනු ලබන්නේ මුදලින් ද චෙක්පතකින් ද නැතහොත් බැංකු අණකරයකින් ද යන්න සඳහන් කරන්න.

..........................................................................................

දිනය ..........................................................................................

මුදල (වචනයෙන්) ..........................................................................................

නිර්දේශය ..........................................................................................

..........................................................................................

බංකර් බලපත්‍ර ගාස්තුව

බැංකු අණකර යොමු අංකය ..........................................................................................

දිනය ..........................................................................................

මුදල (වචනයෙන්) ..........................................................................................

**II** වන උපලේඛනය

*2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත*

*ශ්‍රී ලංකා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය (MEPA)*

**බංකර් පහසුකම් සඳහා බලපත්‍රය (සමුද්‍රීය පරිසර ආරක්ෂණ)**

(2008 අංක 35 දරන සමුද්‍රීය දූෂණය වැළැක්වීමේ පනතේ
විධිවිධාන යටතේ නිකුත් කරන ලද) නියෝග අංක 02/2011

| | | |
|---|---|---|
| සහතික අංකය | : | .......................................................... |
| යාත්‍රාවේ නම/ වාහන වර්ගය | : | .......................................................... |
| ලියාපදිංචි කළ වරාය | : | .......................................................... |
| අයි.එම්.ඕ අංකය/වාහන ලියාපදිංචි අංකය | : | .......................................................... |
| දළ ධාරිතාව ටොන්වලින් / ධාරිතාව | : | |
| යාත්‍රාවේ වර්ගය | : | .......................................................... |
| අයිතිකරු | : | .......................................................... |
| කළමණාකරු/බංකර් ක්‍රියාකරු | : | .......................................................... |

.................විසින් කළමනාකරණය කරනු ලබන සහ ක්‍රියාත්මක කරනු ලබන ඉහත කී යාත්‍රාව/මාර්ග බංකරය මෙම අධිකාරිය විසින් නම් කරන ලද මානකවරයකු විසින් යථා පරිදි සමීක්ෂණය කර එය බංකරින් මෙහෙයුම් සඳහා අවශ්‍ය නියමයන්ට අනුකූල බවට තීරණය කරනු ලැබූ බව මෙයින් සහතික කරමි.

බංකර් සැපයුම් මෙහෙයුම් සඳහා අධිකාරිය විසින් පනවන ලද පහත දැක්වෙන කොන්දේසිවලට යටත්ව මෙම බලපත්‍රය ලිත් වර්ෂ එකක කාලයක් සඳහා වලංගු වේ.

කොන්දේසි -

1. සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් බලය පවරන ලද නිලධරයන්ට හෝ එකී අධිකාරියේ ප්‍රධාන විධායක නිලධරයා විසින් ලිඛිතව තත්කාර්ය සඳහා බලය පවරන ලද වෙනත් යම් නිලධරයකුට කවර හෝ අවස්ථාවක දී යාත්‍රාවට ඇතුළු වී මෙම බලපත්‍රය වලංගු කාලසීමාව ඇතුළත අධිකාරිය විසින් බලය පවරන ලද නිලධරයන් විසින් අවශ්‍ය යයි සළකනු ලබන පරීක්ෂණ කලින් කල පැවැත්වීමට එම බලපත්‍රය දරන්නන් විසින් අවසර දිය යුතු ය.

2. අධිකාරිය විසින් කලින් කල දැනුම් දෙනු ලබන වෙනත් යම් නියමයන්ට බලපත්‍රය දරන්නා විසින් අනුකූලව ක්‍රියා කළ යුතු ය.

..........................................................

නිකුත් කළ දිනය සාමාන්‍යාධිකාරි

**III** වන උපලේඛනය

*2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත*

*වෙරළේ දී බංකර් තෙල් පහසුකම සඳහා වූ ඉල්ලුම් පත්‍රය.*
*(අළුත් සහ අළුත් කිරීම්)*

ඉල්ලුම්පත් අංකය

බලපත්‍රය අළුත් හෝ අළුත් කිරීම සඳහා වන ඉල්ලුම් පත්‍රයක් ද යන්න සඳහන් කරන්න.

(උචිත පරිදි ලකුණු කරන්න)

අළුත්
අළුත් කිරීම

අ වගන්තිය - ඉල්ලුම්කරු / සමාගම පිළිබඳ විස්තර

අ1 සමාගමේ / වෙළඳ ව්‍යාපාරයේ නම

අ2 ජාතිය

අ3 ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය

අ4 ශ්‍රී ලංකාවේ ව්‍යාපාර ලිපිනය

අ5 ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ අංකය

අ6 සම්බන්ධ කරගත හැකි විස්තර

(අ) පුද්ගලයාගේ නම

(ආ) දුරකථන අංකය

(ඇ) ෆැක්ස් අංකය

(ඈ) විද්‍යුත් තැපෑල

අ7 ඉල්ලුම්කාර සමාගම/ වෙළඳ ව්‍යාපාරය
විසින් දරනු ලබන කොටස් වල ප්‍රතිශතය

අ8 වෙනත් තැනැත්තන් විසින්
දරනු ලබන කොටස්වල ප්‍රතිශතය
(විස්තර දක්වන්න)

ආ වගන්තිය -

ආ1 - වෙරළේ දී බංකර් තෙල් පහසුකම් සැපයීම පිළිබඳ විස්තර
විස්තර සපයන්න අදාළ පිටපත් අමුණන්න

ගබඩා කිරීම සහ මෙහෙයවීම
ඇ1 ගබඩා කිරීමේ පහසුකම් පිළිබඳ විස්තර (උචිත පරිදි ඉදිරිපත් කරන්න)

| *ගබඩා කර ඇති අයිතම* | *පිහිටීම* | *ගබඩා කළ හැකි ටැංකිවල ධාරිතාව* |
|---|---|---|
| ඇ1.1 වාහන ඉන්ධන (ඒ.ජී.ඕ) | | |
| ඇ1.2 ඉන්ධන තෙල් | | |
| ඇ1.3 වෙනත් (නිශ්චිතව දක්වන්න)<br>I | | |
| II | | |

| | |
|---|---|
| අ. වැඩබිම් ලිපිනය | |
| ආ. වැඩබිම් කාර්යාලීය දුරකථන අංක | |
| ඇ. වැඩබිමේ ව්‍යාපෘතිය | |
| ඈ. ගබඩා කළ හැකි ටැංකිවල මුළු ධාරිතාව | |
| ඉ. ටැංකි ප්‍රමාණය සහ එක් එක් ටැංකිවල ධාරිතාව | |
| ඊ. ටැංකිය සාදා ඇති ද්‍රව්‍ය සහ එක් එක් ටැංකිවල ඝනකම | |
| උ. ගිනි නිවීමේ උපකරණ සහ ගිනි නිවීමේ සැළැස්ම පිළිබඳ විස්තර | |
| ඌ. තෙල් පිටාර ගැලීම මැඩ පැවැත්වීමේ උපකරණ සහ හදිසි අවස්ථා සැළැස්ම | |

ඇ 2- මෙහෙයුම් කාර්යාලය පිළිබඳව විස්තර (6අ ට වෙනස්නම්)

| | |
|---|---|
| ඇ2.1 සම්බන්ධ කර ගත හැකි තැනැත්තාගේ විස්තර | |
| ඇ2.2 ලිපිනය | |
| ඇ2.3 දුරකථන අංකය | |
| ඇ2.4 ෆැක්ස් අංකය | |
| ඇ2.5 විද්‍යුත් ලිපිනය | |

| | |
|---|---|
| අ. වැඩබිම් ලිපිනය | |
| ආ. වැඩබිමේ කාර්යාලයේ දුරකථන අංක | |
| ඇ. වැඩබිමේ ප්‍රමාණය | |
| ඈ. ටැංකිවල ගබඩා කළ හැකි මුළු ධාරිතාව | |
| ඉ. ටැංකි භාජන සහ එක් එක් ටැංකිවල ධාරිතාව | |
| ඊ. ටැංකිය සාදා ඇති ද්‍රව්‍ය සහ එක් එක් ටැංකිවල ඝනකම | |
| උ. ගිනි නිවීමේ උපකරණ සහ ගිනි නිවීමේ සැළැස්ම පිළිබඳ විස්තර | |
| ඌ. තෙල් පිටාර ගැලීමේ උපකරණ සහ හදිසි අවස්ථා සැළැස්ම පිළිබඳ විස්තර | |

හදිසි පිටාර ගැලීම, ගිනි හෝ වෙනත් හදිසි තත්වයන් හේතු කොටගෙන සිදු වූ අලාභය අවම කිරීම සඳහා දැනටමත් ගෙන ඇති අවම කිරීමේ පියවර පිළිබඳ විස්තර.

| හදිසි අනතුර | අවම කිරීමේ පියවර |
|---|---|
| පිටාර ගැලීම | පස් කන්ඩිය |
| | |
| | |
| | |

මේ ඉල්ලුම්පත්‍රයෙහි මා විසින් ඉදිරිපත් කර ඇති විස්තර සත්‍ය හා නිවැරදි බවට මම මෙයින් සහතික කරමි. මෙහි සඳහන් යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි සහගත බවට තීරණය කරනු ලැබුවහොත් මගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කරන බවටත්, බලපත්‍රය අවලංගු කළ හැකි බවත් මම දනිමි.

..........................................................

ඉල්ලුම්කරුගේ අත්සන නිලමුද්‍රාව සහ දිනය

**IV වන උපලේඛනය**

*2008 අංක 35 දරන සමුද්‍රිය දූෂණය වැළැක්වීමේ පනත*

*ශ්‍රී ලංකා සමුද්‍රිය පරිසර ආරක්ෂණ අධිකාරිය (MEPA)*

**2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනතේ විධිවිධාන යටතේ නිකුත් කරන ලද නියෝග අංක ........... වෙරළෙහි බංකර් තෙල් පහසුකමක් සඳහා වූ බලපත්‍රය - (සමුද්‍රිය පරිසර ආරක්ෂණ)**

-------- විසින් කළමනාකරණය කරනු ලබන සහ ක්‍රියාත්මක කරනු ලබන ------------- පිහිටි බංකර් තෙල් පහසුකමට මෙම අධිකාරිය විසින් නම් කරන ලද මානකවරයකු විසින් යථා පරිදි සමීක්ෂණය කර, එය බංකර් තෙල් ගබඩා කිරීම සඳහා අවශ්‍ය යැයි පනවන ලද නියමයන්ට අනුකූල බවට තීරණය කරනු ලැබූ බව මෙයින් සහතික කරමි.

බංකර් සැපයුම් මෙහෙයුම් සඳහා අධිකාරිය විසින් පනවන ලද පහත දැක්වෙන කොන්දේසිවලට යටත්ව -------- දින සිට ------------ දක්වා මෙම බලපත්‍රය අවුරුදු එකක කාලයක් සඳහා වලංගු වේ.

කොන්දේසි :-

1. මෙම බලපත්‍රයේ නිශ්චිතව දැක්වෙන කාලය සඳහා එය වලංගු වන අතර එය නිකුත් කළ දින සිට අවුරුදු එකකට නොවැඩි කාලයකට විය යුතු ය.

2. සමුද්‍රිය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් බලය පවරන ලද නිලධරයන්ට හෝ එකී අධිකාරියේ ප්‍රධාන විධායක නිලධරයා විසින් ලිඛිතව තත්කාර්ය සඳහා බලය පවරන ලද වෙනත් යම් නිලධරයකුට කවර හෝ අවස්ථාවකදී යාත්‍රාවට ඇතුළු වී මෙම බලපත්‍රය වලංගු කාල සීමාව ඇතුළත අධිකාරිය විසින් බලය පවරන ලද නිලධරයන් විසින් අවශ්‍ය යයි සළකනු ලබන පරීක්ෂණ පැවැත්වීමට එම බලපත්‍රය දරන්නන් විසින් අවසර දිය යුතු ය.

3. අධිකාරිය විසින් කලින් කල දැනුම් දෙනු ලබන වෙනත් යම් නියමයන්ට බලපත්‍රය දරන්නා විසින් අනුකූලව ක්‍රියා කළ යුතු ය.

.........................................................

නිකුත් කල දිනය සාමාන්‍යාධිකාරි

**v වන උපලේඛනය**

*2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත 2008*

- ඉල්ලුම්පත් ගාස්තුව රුපියල් 1,000/-
- වාර්ෂික බලපත්‍ර ගාස්තුව - එක් එක් යාත්‍රාව සඳහා රුපියල් 1,50,000/-
- එක් එක් මාර්ග ටැන්කර් සඳහා - වාර්ෂික බලපත්‍ර ගාස්තුව රුපියල් 5,000/-
- වෙරළෙහි තෙල් ගබඩා ටැංකි සඳහා - බලපත්‍ර ගාස්තුව රු. 30,000/-

02 - 147

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.